# මාධ්‍ය නිවේදනය

## අ.පො.ස (සා/පෙළ) විභාගය - 2024 (2025)

## ප්‍රතිඵල නැවත සමීක්ෂණය සඳහා අයදුම්පත්‍ර කැඳවීම

01. උක්ත විභාගයේ නැවත සමීක්ෂණ අයදුම්පත්‍ර මාර්ගගත ක්‍රමයට පමණක් කැඳවනු ලැබේ.

02. අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී පාසල් හා පෞද්ගලික අයදුම්කරුවන් තමන් විසින්ම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

03. අයදුම්පත් භාරගැනීම 2025.07.14 දින සිට 2025.07.28 දක්වා සිදුකරනු ලැබේ.

04. නැවත සමීක්ෂණය සඳහා අයදුම් කිරීමට පහත දැක්වෙන ක්‍රමයක් අනුගමනය කරන්න.

- විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය (https://www.doenets.lk) වෙත පිවිස "අපගේ සේවා" යටතේ ඇති :"Exam Information Centre" මත Click කිරීම මගින්.
- විභාග දෙපාර්තමේන්තුවේ නිල ජංගම දුරකථන යෙදවුම (Mobile Application) වන DOE වෙත පිවිස "Exam Information Centre" මත Click කිරීම මගින්.
- https://onlineexams.gov.lk/eic වෙත පිවිසීම මගින්.

05. ඔබට දැනටමත් පරිශීලක ගිණුමක් පවතී නම් පද්ධතියට පිවිසීමේ දී ඔබ 2024(2025) - අ.පො.ස. (සා/පෙළ) විභාගයට පෙනී සිටි විභාග අංකය සහ ජාතික හැඳුනුම්පත් අංකයම භාවිතා කිරීමට සැලකිලිමත් විය යුතුය. පරිශීලක ගිණුමක් නොමැති නම් ජාතික හැඳුනුම්පත් අංකය හා ඔබගේ දුරකථන අංකය ඇතුළත් කර ලියාපදිංචි විය යුතුය.

06. අයදුම්පත් සම්පූර්ණ කිරීමට ප්‍රථම Technical Instructions, Common Instructions සහ උපදෙස් වීඩියෝව නැරඹීම, නිවැරදි ආකාරයට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කිරීම සඳහා අත්‍යාවශ්‍ය වේ.

07. එක් විෂයයක් සඳහා නැවත සමීක්ෂණය කිරීමේ ගාස්තුව රු. 200/- කි. Credit කාඩ් / Debit කාඩ් මගින් හෝ තැපැල් කාර්යාල මගින් ගෙවීම් සිදුකළ හැකිය.

08. මුදල් ගෙවීමෙන් පසු අයදුම්පත්‍රය PDF ක්‍රමයට බාගත (Download) කරගත හැකි අතර, එම අයදුම්පත්‍රය ඔබ භාරයේ තබාගත යුතුය. එසේම මුදල් ගෙවීමෙන් පසු ඔබගේ ජංගම දුරකථන අංකයට SMS පණිවිඩයක් ද ලැබෙනු ඇත.

09. නැවත සමීක්ෂණය සිදු කිරීමට අවශ්‍ය සියලුම විෂයයන් සහිතව නිවැරදිව අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීම අයදුම්කරුවන්ගේ වගකීම වේ. අදාළ ගාස්තුව ගෙවා නොමැති අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. අයදුම්පත්‍ර සඳහා ගෙවා ඇති ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

10. මේ සම්බන්ධයෙන් කිසියම් විමසීමක් අවශ්‍ය වන්නේ නම් පහත දැක්වෙන දුරකථන අංක මගින් විමසීම් කළ හැක.

| | | |
|---|---|---|
| **පාසල් විභාග ඇගයීම් ශාඛාව** | - | **011-2785231 / 011-2785216 / 011-2784037** |
| **ක්ෂණික ඇමතුම් අංකය** | - | **1911** |

**ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ**
**විභාග කොමසාරිස් ජනරාල්**